අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/08/26/27/02/

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2020.07. 27

**චක්‍රලේඛ අංකය - 18/2020**

සියලු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන පරිපාලන),

සියලුම විෂය අධ්‍යක්ෂවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,

සියලුම කොට්ඨාශ අධ්‍යාපන නිලධාරීන්,

සියලුම විදුහල්පතිවරුන්,

**<u>සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ජාතික ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය ලෙස e-තක්සලාව, ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය ප්‍රකාශයට පත්කිරීම සහ භාවිතය ප්‍රචලිත කිරීම.</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් පද්ධතිය සඳහා 2013 වර්ෂයේ දී හඳුන්වාදෙන ලද e -තක්සලාව ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය, මේ වනතෙක් ප්‍රශස්ත සේවාවක් සිදුකරනු ලබන බැවින් සහ එහි අවශ්‍යතාවය මැනවින් තහවුරු වී ඇති බැවින්, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා වන ජාතික නිල ඉගෙනුම් අන්තර්ගත පද්ධතිය ලෙස "e -තක්සලාව", මෙ මගින් ප්‍රකාශයට පත් පත්කරනු ලැබේ.

**මෙම පද්ධතියට https://e-thaksalawa.moe.gov.lk මගින් ප්‍රවේශ විය හැක.**

**02.** e -තක්සලාව, 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් පවත්වනු ලබන ජාතික මෘදුකාංග ඇගයීම සඳහා වන "e-ස්වාභිමානී" තරඟයෙන් ජයග්‍රාහකයා ලෙස ද, දකුණු ආසියා රටවල් කේන්ද්‍ර කරමින් ඉන්දියාවේ පවත්වනු ලැබූ "මාන්තන්" තරඟයෙන් ද ලද ජයග්‍රහණය e -තක්සලාව, ශ්‍රී ලංකාවේ සමස්ත සාමාන්‍ය අධ්‍යාපනය පද්ධතිය වෙත කොතරම් දුරට ගැළපෙන්නේ ද යන්න සඳහා ජාත්‍යන්තර මට්ටමෙන්ද ලබාදෙන ලද සහතිකයක් වේ.

**03.** COVID-19 වසංගත තත්වය හමුවේ බොහෝ රටවල්වල රාජ්‍ය මැදිහත්වීම මත සකස් කළ e -ඉගෙනුම් ක්‍රමවේදයන් පිළිබඳව UNESCO ආයතනය විසින් සිදුකරන ලද අධ්‍යනයකට අනුව ජාතික මට්ටමේ ඉගෙනුම් පද්ධති යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නිල ඉගෙනුම් පද්ධතිය ලෙස e-තක්සලාව නිර්දේශකර ප්‍රකාශයට පත්කර ඇත.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

**04.** ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ඉතාමත් ශක්තිමත් සහ පුළුල් පරාසයක ලාක්ෂණික සහිත ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් ලෙස e -තක්සලාව මේ වනවිට ස්ථාපිතව ඇති අතර ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් සතුවිය යුතු සියලුම භාවිතාවන්වලින් මෙම පද්ධතිය සමන්විත වීම හේතුවෙන් අනාගතයේ සිදුකළ යුතු සම්මිශ්‍රිත (Blended) ඉගෙනුම් ක්‍රමවේද හඳුන්වාදීම් වැනි අධ්‍යාපනික ක්‍රමවේද සඳහා ද මෙම පද්ධතිය තුළ අවකාශ සළසා ඇත.

**05.** ඒ අනුව, පහත සඳහන් ප්‍රධාන කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන බව දන්වා සිටිමි.

**5.1 e - තක්සලාව භාවිතය.**

පළාත් සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු සියලුම ආයතන ප්‍රධානීන් විසින් තම පළාත තුළ හෝ කලාපය තුළ හෝ ආයතනය තුළ හුදකලා සහ අසම්පූර්ණ ඉගෙනුම් අන්තර්ගත පද්ධති නිර්මාණය කිරීම වෙනුවට <u>e -තක්සලාව භාවිත කිරීම අත්‍යවශ්‍ය වන අතර එයට දායකත්වය ලබා දීමට කටයුතු කළ යුතුය.</u>

e -තක්සලාවෙහි භාවිතය නිල වශයෙන් ප්‍රචලිත කිරීම සඳහා සියලුම පාසල්, ගුරු මධ්‍යස්ථාන, පරිගණක සම්පත් මධ්‍යස්ථාන සහ විද්‍යාපීඨයන්හි සුදුසු වැඩපිළිවෙළක් ආයතන ප්‍රධානීන්, විෂය අධ්‍යක්ෂවරුන්, කථිකාචාර්යවරුන්, ගුරුවරුන් සහ අදාළ නිලධාරීන් විසින් පවත්වාගෙන යා යුතුය.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අධ්‍යාපන හදාරනු ලබන අධ්‍යාපන ශික්ෂණ ඩිප්ලෝමා අපේක්ෂක ගුරු සිසුන් සඳහා 2020 වර්ෂයේ නව බඳවා ගැනීම් සමඟ සියලුම අභ්‍යාසලාභීන්ට තමාට අදාළ වසර 03 තුළ අධ්‍යාපන ක්‍රියාවලියට භාවිත කිරීමට අවශ්‍ය අත්‍යත්‍ය ඉගෙනුම් අවකාශයක් e - තක්සලාව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය තුළ ලබා දීමට පියවර ගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සම්පාදනය කරනු ලැබේ. සියලුම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් එම ඉගෙනුම් අවකාශය ප්‍රශස්තව භාවිත කිරීම සඳහා කථිකාචාර්යවරුන් සහ අභ්‍යාසලාභී ශික්ෂණ ඩිප්ලෝමා අපේක්ෂක සිසුන් යොමු කිරීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

**5.2 e -තක්සලාව ප්‍රවේශ අවස්ථා පුළුල් කිරීම.**

පාසල්, පරිගණක සම්පත් මධ්‍යස්ථාන, ගුරු මධ්‍යස්ථාන සහ විද්‍යාපීඨයන්හි ඉ-ඉගෙනුම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන ඕනෑම ක්‍රියාකාරකමක් හෝ ව්‍යාපෘතියක්, e -තක්සලාව නිල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය මූලික කරගනිමින් සිදුකිරීම අවශ්‍ය වේ. මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා සිසුන්ට භාවිත කළ හැකි පරිදි e -තක්සලාව පද්ධතිය තුළ අවශ්‍ය පහසුකම් සකස් කරමින් පවතින අතර එම පද්ධතිය පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම දියත්කළ පසු, පාසල් මගින් සංවිධානය කරනු ලබන, සිසුන් හා ගුරුවරුන් අතර වූ ඉ-ඉගෙනුම් සැසි, මාර්ගගත පන්ති කාමර වැනි අත්‍යත්‍ය (virtual) වැඩසටහන් e-තක්සලාවේ මාර්ගගත ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

**5.3 e -තක්සලාවේ අන්තර්ගතයන් නිර්මාණය සඳහා දායක වීම.**

ඔබගේ ආයතන රජයේ මුදල් භාවිතකර නිෂ්පාදනය කරනු ලබන සියලුම ඉලෙක්ට්‍රොනික අන්තර්ගතයන්හි හෝ ප්‍රශ්න පත්‍රවල පිටපතක් e -තක්සලාවෙහි අන්තර්ගත කිරීම සළකා බැලීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාරදිය යුතුය.

සියලුම පාසල් විසින් සකස් කරනු ලබන වාර අවසාන පරීක්ෂණවලට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර, අදාළ විභාගය අවසන් වී මාසයක් ඇතුළත e-තක්සලාව තුළ ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ලබාදිය යුතුය.

**5.4 e -තක්සලාව හැර වෙනත් එවන් ඉගෙනුම් අන්තර්ගත පද්ධති ක්‍රියාත්මක නොකිරීම.**

විවිධ පෞද්ගලික ආයතන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන හා ආයතන විසින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු, කලාප අධ්‍යාපන කාර්යාල, පළාත් හා ජාතික පාසල්, පරිගණක සම්පත් මධ්‍යස්ථාන, ගුරු මධ්‍යස්ථාන සහ විද්‍යාපීඨයන් හඳුන්වාදීමට යෝජනා කරනු ලබන විවිධ ඉගෙනුම් කළමනාකරණ පද්ධති සඳහා ඔබගේ එකඟතාවය ලබා දීම කිසිසේත් සිදු නොවිය යුතුය.

එම ආයතන / සංවිධාන විසින් ලබා දෙන යම්කිසි විෂයානුබද්ධ විෂය අන්තර්ගතයක් වේ නම් නිසි ඇගයීම් ක්‍රමවේදයක් මගින් ගුණාත්මක බව තහවුරුකර අදාළ නිර්දේශ සමඟ e -තක්සලාව ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය තුළ ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමුකිරීම අවශ්‍ය වේ.

විශේෂයෙන්ම, ඉගෙනුම් කළමනාකරණ පද්ධතිවල තිබිය යුතු ගුණාංගවලින් ඉතා අල්ප කොටසක් සහිතව හුදකලා පද්ධති නිර්මාණය කිරීම, නඩත්තු කිරීම, ආරක්ෂණ පියවර පවත්වාගැනීම සහ තොරතුරු ගබඩා කිරීම වැනි දෑ සඳහා අනවශ්‍ය පරිදි ගත කරන කාලය, පිරිවැය මෙන්ම ඒ සඳහා යොදවනු ලබන මානව සම්පත ද අපතේ යාමක් බව හඳුනාගෙන ඇත.

එමෙන්ම එසේ ආරම්භ කරනු ලබන බොහොමයක් පද්ධති කෙටි කලක් තුළදී අකර්මන්‍ය වීම මගින් අධ්‍යාපන පද්ධතිය ද අහිතකර ලෙස විවේචනයට ලක්වීම සිදුවන බව අවධානයට යොමු වී ඇති අතර ජාතික වශයෙන් සියලුම සිසුන්ට ද භාවිත කළහැකි පොදු පද්ධතියක් තුළ සියලුම අන්තර්ගතයන් අඩංගු කිරීම මගින් විශාල වපසරියක ඉගෙනුම් කරුණු සියලුම සිසුන්ට දීර්ඝ කාලයක් පරිශීලනය කිරීමේ අවස්ථාව ද e -තක්සලාව මගින් හිමිවන බැවින් මේ අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා ඔබගේ කාර්ය මණ්ඩලය, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම නිලධාරීන් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය බව වැඩිදුරටත් අවධාරණය කරමි.

එන්. එච්. එම්. චිත්‍රානන්ද,

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත් :-

1. විගණකාධිපති,
2. පළාත් ප්‍රධාන ලේකම්වරු,
3. සියලුම අතිරේක ලේකම්වරු, අධ්‍යාපන අමාත්‍යාංශය.
4. පළාත් අධ්‍යාපන ලේකම්වරු,
5. විභාග කොමසාරිස් ජනරාල්,
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය,
8. ලේකම් ජනරාල්, ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව,
9. සභාපති, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය (ICTA),
10. අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් හා මූල්‍ය), අධ්‍යාපන අමාත්‍යාංශය.
11. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධ්‍යාපන අමාත්‍යාංශය.
12. සියලුම ප්‍රධාන ගණකාධිකාරීවරුන්, අධ්‍යාපන අමාත්‍යාංශය.